සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, End Year Test, July 2019**

**ගිණුම්කරණය - I**
**Accounting - I**

33 S I

පැය 01 යි. මි. 45
One hour. 45 min.

නම : .................................................... පන්තිය : ...................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 26 සිට 40 තෙක් ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.

1. මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ / ප්‍රකාශන නිවැරදි වේ ද?
   A. ගිණුම් කාල පරිච්ඡේදයක් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ.
   B. ව්‍යාපාරය පිළිබඳව ඇල්මක් දක්වන පර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සපයනු ලැබේ.
   C. වත්කම් වගකීම් හා හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග ලෙස හඳුනා ගනී.
   (1) B පමණි (2) A ,B,C (3) A හා B (4) B හා C (5) A ,C (.........)

2. පොදු ලෙජරය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ /ප්‍රකාශනවලින් කුමක් නිවැරදි වේ ද?
   A පොදු ලෙජරය ද්විත්ව සටහන් ක්‍රමයට පවත්වාගෙන යනු ලැබේ.
   B සියලුම ලෙජර් ගිණුම් මුදල් ලැබීම් හා ගෙවීම් ජ'නලය පදනම් කරගෙන සකස් කරයි.
   C පොදු ලෙජරයේ සියලු ගිණුම් ශේෂ කර ඉදිරියට ගෙන යනු ලැබේ.
   D මුදල් පාලන ගිණුම පොදු ලෙජරයේ වත්කම් ගිණුමකි.
   (1) A (2) A,C (3) A,B,C (4) A,C,D (5) A,D (.........)

3. ව්‍යාපාර වල කලමනාකරණ හා සේවක දක්ෂතා පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්නට නොලැබේ. මෙම තත්තවය ඇති වීමට බලපා ඇති ගිණුම් කරණ සංකල්පය,
   (1) ව්‍යාපාර ඒකක (2) උපචිත (3) ගැලපුම් (4) මූල්‍ය මිණුම් (5) අඛණ්ඩ පැවැත්ම (.........)

4. මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියට අදාළ වන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.
   A. ජ'නල්වල වාර්තා කිරීම
   B. ලෙජරයට පිටපත් කිරීම
   C. ගණුදෙනු හා සිද්ධීන් ඇති වීම හා මූලාශ්‍ර ලේඛන සකස් කිරීම.
   D. ශේෂ පිරික්සුම සකස් කිරීම.
   ඉහත ගිණුම්කරන ක්‍රියාවලියේ නිවැරදි අනුපිළිවෙල වන්නේ,
   (1) A,B,C,D (2) C,B,A,D (3) D,B,A,C (4) B,C,A,D (5) C,A,B,D (.........)

5. ශ්‍රී ලංකාවට මෝටර් රථ ආනයනය කිරීමේදී රේගු බදු වැඩි කරන ලදි මෙම හේතුව නිසා මෝටර් රථවල වටිනාකම වැඩිවිය මෙයට බලපා ඇති ගිණුම්කරණ පරිසර සාධකය වන්නේ,
   (1) ආර්ථික හා දේශපාලන පරිසරය (2) තාක්ෂණික පරිසරය
   (3) නෛතික පරිසරය (4) ශිල්පීය හා වෘත්තීය පරිසරය
   (5) සමාජ හා සංස්කෘතික පරිසරය (.........)

6. ව්‍යාපාරයක 2019 ජනවාරි මාසයේදී සිදුවූ ගණුදෙනු

1. රු 60000 ක තොග ණයට ගන්නා ලදී.
2. රු 40000 ක් පිරිවැය වූ තොග රු.52000 කට ණයට විකුණන ලදී.
3. ජනවාරි මස විදුලි බිල රු.1500 අයිතිකරු පෞද්ගලික මුදලින් ගෙවන ලදී.

ඉහත ගණුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට ඇතිවන ශුද්ධ බලපෑම,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | +60000 | | | | +60000 |
| (2) | +72000 | | +12000 | | +60000 |
| (3) | +12000 | | +12000 | | |
| (4) | +73500 | | +13500 | | +60000 |
| (5) | +70500 | | +10500 | | +60000 |

(.........)

පහත තොරතුරු ප්‍රශ්න අංක 06 හා 07 ට අදාළ වේ.

2019 අප්‍රේල් මස මුදල් සාරාංශය (රු.000)

| | |
|---|---|
| 2019.04.01 දිනට මුදල් ශේෂය / බැංකු ශේෂය | 300 |
| මුදල් ලැබීම් ජ'නලය එකතුව | 4500 |
| මුදල් ගෙවීම් ජ'නලය එකතුව | 3700 |

අප්‍රේල් මාසය සඳහා ලද බැංකු ප්‍රකාශනය සමග මුදල් ජ'නල් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ තොරතුරු

| | |
|---|---|
| උපලබ්දි නොවූ චෙක් පත් | 360 |
| නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් පත් | 420 |
| ස්ථාවර නියෝගමත ගෙවීම් | 100 |
| ගණුදෙනුකරුවන්ට නිකුත් කළ අගරු වූ චෙක් පත් | 250 |

7. 2019 අප්‍රේල් 30 දිනට නිවැරදි බැංකු ශේෂය

(1) 1250 (2) 950 (3) 1100 (4) 750 (5) 610 (.........)

8. 2019 අප්‍රේල් 30 දිනට බැංකු ගිණුම් ප්‍රකාශනය අනුව ශේෂය

(1) 1100 (2) 1250 (3) 950 (4) 1310 (5) 1190 (.........)

9. නිෂ්පාදන ව්‍යාපාරයක මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට අදාළ නිවැරදි ගණිතමය ප්‍රකාශනය වන්නේ,

(1) ප්‍රාථමික පිරිවැය + පොදු කාර්ය පිරිවැය

(2) ඍජු පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + පොදු කාර්ය පිරිවැය

(3). ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + ඍජු වෙනත් පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

(4) ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + ඍජු වෙනත් පිරිවැය + පොදු කාර්ය පිරිවැය

(5) ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (.........)

10. විධිමත් ගිණුම් පොත් පංතියක් තබා නොගන්නා ව්‍යාපාරවල ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා යොදා ගන්නා සමීකරණය වන්නේ,

(1) අවසාන හිමිකම - ආරම්භක හිමිකම - ගැනිලි
(2) අවසාන හිමිකම - ආරම්භක හිමිකම + ගැනිලි
(3) අවසාන හිමිකම - ආරම්භක හිමිකම - ගැනිලි + අමතර ප්‍රාග්ධනය
(4) අවසාන හිමිකම - ආරම්භක හිමිකම + ගැනිලි - අමතර ප්‍රාග්ධනය
(5) ආරම්භක හිමිකම - අවසාන හිමිකම + ගැනිලි - අමතර ප්‍රාග්ධනය (.........)

11. පහත සඳහන් ගිණුම් හා ප්‍රකාශනවලින් මූල්‍ය ප්‍රකාශනවල සංරචක වන්නේ,

A බැංකු සැසඳුම් ප්‍රකාශනය B ආදායම් ප්‍රකාශනය
C මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය D සමුච්චිත අරමුදල් ගිණුම

(1) A,C,D (2) B හා C (3) A,B,C,D (4) B,C,D (5) C හා D (.........)

**පහත සඳහන් තොරතුරු ප්‍රශ්න අංක 12 හා 13 ට අදාළ වේ.**

නවින් 2018. 04. 01 දින රු 60000 ක් ප්‍රාග්ධනය යොදා ව්‍යාපාරයක් අරඹන ලදී.

2019. 03. 31 දිනට මුළු වත්කම් 96000

වෙළඳ ණයහිමියෝ 12000

වෙනත් තොරතුරු

වර්ෂයේ මෙහෙයුම් වියදම් රු 36000

වෙනත් ආදායම් රු 3000

12. 2019. 03. 31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය,

(1) 86000 (2) 24000 (3) 27000 (4) 39000 (5) 33000 (.........)

13. 2019. 03. 31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය,

(1) 60 000 (2) 63 000 (3) 69 000 (4) 72 000 (5) 57 000 (.........)

**පහත සඳහන් තොරතුරු ප්‍රශ්න අංක 14 හා 15 ට අදාළ වේ.**

අමල් හා නිමල් හවුල් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතුරු (රු 000)

| | | 2018.04.01 දිනට | 2019. 03. 31 දිනට |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | අමල් | 2000 | 2400 |
| | නිමල් | 1800 | 1800 |
| ජංගම ගිණුම | අමල් | 780 | 1470 |
| | නිමල් | 910 | 1510 |

2019. 03. 31 දිනෙන් අවසන් වර්ෂයේ පොත් වල වාර්තා කරන ලද තොරතුරු.

(i) ගැනිලි අමල් 210 000

නිමල් 160 000

(ii) අමල් රු 400 000 අතිරේක ප්‍රාග්ධනයක් යොදවන ලදී.

14. 2019. 03. 31 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම (රු.000)

(1) 3800 (2) 4200 (3) 7180 (4) 7080 (5) 549 (.........)

15. 2019. 03. 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභය (රු.000)

(1) 1250 (2) 1660 (3) 2050 (4) 1280 (5) 880 (.........)

16. ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් පිළිබඳ තොරතුරු

| | 20918. 04. 01 දිනට | 2019. 03. 31 දිනට |
|---|---|---|
| හිඟ සාමාජික මුදල | 300 | 400 |
| කලින් ලද සාමාජික මුදල් | - | 200 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් සාමාජික මුදල් ආදායම රු. 15000 කි.

වර්ෂය තුල ලද සාමාජික මුදල වන්නේ,

(1) 14700 (2) 15200 (3) 15300 (4) 15500 (5) 15100 (.........)

17. ව්‍යාපාරික ආයතනයක් 2019. 03. 31 දිනෙන් අවසන් වූ වර්ෂයේදී රු 200 000 පිරිවැය වූ තොග විකිනීම හෝ ආපසු එවීම පදනම මත යවා ඇති අතර එහි විකුණුම් මිල රු 240 000 කි. මෙම තොග යැවූ දින ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කර ඇත.

2019. 03. 31 දිනට මෙම තොගවලින් $\frac{1}{4}$ විකුණා තිබුණේ නැත.

ඉහත ගැලපීම් සටහන වර්තා කිරීම තුලින් ශුද්ධ ලාභයට ඇති වන බලපෑම

(1) රු 60 000 කින් අඩුවේ (2) රු 50 000 කින් අඩුවේ (3) රු 40 000 කින් අඩු වේ

(4) රු 10 000 කින් අඩුවේ (5) රු 10 000 වැඩි වේ (.........)

18. හවුල් ව්‍යාපාරයක ගිණුම් වාර්තා සම්බන්ධයෙන් ප්‍රකාශන කිහිපයක් පහත දක්වේ. ඒවායින් **වැරදි ප්‍රකාශනය** වන්නේ,

(1) සෑම හවුල්කරුවකුටම ප්‍රාග්ධනයට සමාන ලෙස දායක වීමට අයිතියක් ඇත.

(2) හවුල් ගිවිසුමට අනුව වේතන ලබා ගැනීමට අයිතියක් ඇත.

(3) හවුල්කරුවන් ව්‍යාපාරයට ලබාදෙන ණය සඳහා පොලී අනුපාතයක් සඳහන් නොවන්නේ නම් 5%පොලියක් ගෙවිය යුතුය

(4) හවුල් ව්‍යාපාර වල අයිතිය වෙනස් වන අවස්ථාවලදී කීර්ති නාමය ගැලපීම් කළ යුතුය.

(5) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් වගකීම් ගිණුම් ලෙස හඳුනා ගනී. (.........)

**පහත තොරතුරු ප්‍රශ්න අංක 19 හා 20 ට අදාළ වේ.**

ව්‍යාපාර ආයතනයක 2019. 03. 31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු 6500 කි. එදිනට ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තු එකතුව මීට වඩා වෙනස් වී ඇත. පසුව පහත වැරදි අනාවරණය විය.

1. රු 600 විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත්වලින් මගහැරී ඇත.
2. විකුණුම් ජ'නලය එකතු කිරීමේදී රු 1000 වැඩියෙන් එකතු කර ඇත.
3. කමල්ට ණයට විකුණුම් රු 800 පොදු ලෙජරයේ සටහන් කර ඇති අතර කමල්ගේ ගිණුමේ රු. 80 ක් ලෙස සටහන් කර ඇත.

19. වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව.

(1) 7580 (2) 7500 (3) 4780 (4) 5420 (5) 5780 (.........)

20. ඉහත වැරදි නිවැරදි කළ පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය

(1) 6100 (2) 7100 (3) 6820 (4) 8820 (5) 8100 (.........)

21. ව්‍යාපාරයක ගිණුම් තැබීමේදී පහත වැරදි සිදු වී ඇත.

1. මුදල් ලැබීම් ජ'නලයේ අත්පිට විකුණුම් තීරුවේ එකතුව රු. 3500 මුදල් පාලන ගිණුමට රු 3000 ලෙස පිටපත් කර ඇත.
2. රු 400 ආපසු එවුම්, ආපසු එවුම් ජ'නලයේ සටහන් කර නැත.
3. ගෙවූ රු. 600 විදුලි ගාස්තු, විදුලි ගාස්තු ගිණුමට රු. 60 ක් ලෙස පිටපත් කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය.

(1) රු 1040 බැර (2) රු 1040 හර (3) රු 1540 හර (4) රු 1540 බැර (5) රු 1160 හර (.........)

22. ලාභ අරමුණු කර නොගත් සංවිධාන වලට අදාළ ප්‍රකාශන කිහිපයක් පහත දක්වේ ඒවායින් නිවැරදි ප්‍රකාශන වන්නේ,

A හිමිකම් වන සමුච්චිත අරමුදල අතිරික්තය හෝ ඌණතාවය නිසා වෙනස්වේ.
B මුදලින් ලද විශේෂ පරිත්‍යාග සංගමයේ වගකීම් වේ.
C ලැබීම් හා ගෙවීම් ගිණුම (මුදල් සාරාංශය) මූල්‍ය ප්‍රකාශනවල සංරචකයකි.
D සාමාජිකයන්ගෙන් ඇතුළත්වීමේ ගාස්තු සෑම වසරකම අය කළ යුතුය.

(1) A,B,C (2) B,D (3) A,C (4) A,B,C,D (5) B හා C (.........)

පහත තොරතුරු ප්‍රශ්න අංක 23 හා 24 ට අදාල වේ.

ව්‍යාපාරයක වෙළඳ ණය ගැතියන්ට අදාල තොරතුරු,

| | 2018.04.01 | 2019.03. 31 |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 2000 | 2600 |
| හානිකරණ අලාභ සඳහා ඉඩ ගැනීම | 200 | 260 |

වර්ෂය තුළදී කපා හරින ලද බොල් ණය රු 210 කි. දුන් වට්ටම රු 40 කි

23. ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා බොල් ණය හා අඩමාන ණය වියදම.

(1) රු 300 (2) රු 240 (3) රු 260 (4) රු 270 (5) රු 310 (.........)

24. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරන අලාභ ඉඩහැරීම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනීමට අදාල ගිණුම්කරණ සංකල්පය.

(1) උපචිත (2) ගැලපුම් (3) ප්‍රමාණාත්මක බව (4) සංගතතා (5) මූල්‍ය මිණුම (.........)

25. ව්‍යාපාර ආයතනයක මූල්‍ය ප්‍රකාශනවලින් ලබාගත් තොරතුරු

| | 2018.04.01 | 2019.03. 31 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රාග්ධන ගිණුම | 5600 | 6800 |
| රඳවාගත් ඉපයුම් | 1300 | 2400 |

පොත් වල වාර්තා කර ඇති අනෙකුත් ගණුදෙනු

| | |
|---|---|
| අතිරේක ප්‍රාග්ධන යෙදවීම් | රු.1200 |
| මුදල් ගැනිලි | රු. 300 |
| භාණ්ඩ ගැනිලි | රු. 200 |

2018 / 2019 ගිණුම් වර්ෂ තුළ උපයා ඇති ශුද්ධ ලාභය

(1) රු.1100 (2) රු.1400 (3) රු.1600 (4) රු.2800 (5) රු.1800 (.........)

**ප්‍රශ්න අංක 26 සිට 40 දක්වා ප්‍රශ්න වලට කෙටි හා නිශ්චිත පිළිතුරු ලියන්න.**

26. මූල්‍ය ගිණුම්කරණය හා කලමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් ලියන්න.

| | මූල්‍ය ගිණුම්කරණය | කලමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| තොරතුරුවල ස්වභාවය | ........................................................................ | ........................................................................ |
| තොරතුරු භාවිත කරන පාර්ශ්ව | ........................................................................ | ........................................................................ |

27. ගිණුම්කරණ සමීකරණයට ඇති වන බලපෑම්වලට අදාළ ගනුදෙනුවක් වටිනාකම සමග ලියන්න.

| බලපෑම | ගනුදෙනුව |
|---|---|
| 1. වත්කම් අඩුවීම, හිමිකම් අඩුවීම (ශුද්ධ ලාභයට බලපෑමක් නොවන) | ........................................................................ |
| 2. වත්කම් වැඩිවීම, වත්කම් අඩුවීම | ........................................................................ |
| 3. වගකීම් වැඩිවීම, හිමිකම් අඩුවීම | ........................................................................ |
| 4. හිමිකම් වැඩිවීම, වගකීම් අඩුවීම | ........................................................................ |

28. පහත සඳහන් ප්‍රකාශන **සත්‍ය ද අසත්‍ය ද** යන්න සඳහන් කරන්න.
   1. මුදල් පාලන ගිණුම වත්කම් ගිණුමකි. ..................................
   2. ව්‍යාපාරයෙන් උපයන ලාභ සෑම විටම මුදල් ශේෂය මඟින් පෙන්නුම් කරයි. ..................................
   3. කාල පරිච්ඡේදය තුළ වත්කම් වල ඇතිවන වැඩිවීම ශුද්ධ ලාභය ලෙස හඳුනා ගනී. ..................................
   4. කාලච්ඡේදය තුල මුදලින් ගෙවූ සියලු වියදම් ආදායම් ප්‍රකාශය තුල වියදම් ලෙස හඳුනාගනී. ..................................

29. පහත සිදුවීම්වලට ගැලපෙන ගිණුම්කරණ සංකල්ප නම් කරන්න

| **සිද්ධිය** | **අදාළ සංකල්පය** |
|---|---|
| 1. විකුණුම් ආදායමෙන් විකුණුම් පිරිවැය අඩු කිරීම | ........................................................................ |
| 2. ප්‍රමාණාත්මක කුඩා වත්කම් වියදම් ලෙස හඳුනා ගැනීම | ........................................................................ |
| 3. ණයට විකුණුම් ආදායම් ලෙස හඳුනා ගැනීම | ........................................................................ |
| 4. රඳවාගත් ඉපයුම් හිමිකමේ කොටසක් ලෙස හඳුනාගැනීම | ........................................................................ |

30. මුදල් ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය වැඩිවීමට බලපාන කරුණු 3ක් ලියන්න.
   1. ........................................................................................................................
   2. ........................................................................................................................
   3. ........................................................................................................................

31. වෙළඳ තොගය සම්බන්ධයෙන් පොදු ජ'නලයේ වාර්තා කරන ගනුදෙනු හෝ සිද්ධීන් 3 ක් නම් කරන්න.
   1. ........................................................................................................................
   2. ........................................................................................................................
   3. ........................................................................................................................

32. පාවහන් නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක පිරිවැය අයිතම කිහිපයක් පහහත දැක්වේ. ඒවා ඍජු හා වක්‍ර වියදම් වශයෙන් වර්ග කර දක්වන්න.

| | ඍජු / වක්‍ර වියදම් |
|---|---|
| 1. පාවහන් සකස් කිරීමට භාවිත කරන සම් පිරිවැය | ........................................................................ |
| 2. පාවහන් සකස් කරන සේවකයින්ගේ වැටුප් | ........................................................................ |
| 3. අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | ........................................................................ |

**පහත තොරතුරු 33 හා 34 ප්‍රශ්නවලට අදාළ වේ.**

නිෂ්පාදන ව්‍යාපාරයක පොත්වලින් උපුටා ගත් තොරතුරු (රු.000)

| | 2018.04.01 | 2019.03. 31 |
|---|---|---|
| අමුද්‍රව්‍ය තොගය | 500 | 800 |
| වෙළඳ ණය හිමියෝ | 720 | 630 |

2018 / 2019 ගිණුම් වර්ෂ සඳහා ගණනය කරන ලද

| | |
|---|---|
| මුළු නිෂ්පාදන පිරිවැය | 9600000 |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | 3600000 |
| ඍජු ශ්‍රම පිරිවැය | 3000000 |

33. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.
   1. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ..........................................................................
   2. අමුද්‍රව්‍ය ගැනුම් පිරිවැය ..........................................................................

34. අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවූ මුදල ..........................................................................

35. ව්‍යාපාරයක පැවති රු 30000 වටිනා වෙළඳ තොග 2019.01.01 දින විනාශ විය. මේ වෙනුවෙන් 2019.01.10 දින ලැබුණ රක්ෂණ වන්දිය රු 25000 කි.
   1. විනාශ වූ තොග පිරිවැය වාර්තා කිරීමේ ජ'නල් සටහන ..........................................................................
   ..........................................................................
   2. තොග හානි අලාභය වාර්තා කිරීමේ ජ'නල සටහන ..........................................................................
   ..........................................................................

36. ව්‍යාපාරයක ගණනය කරන ලද දළ ලාභය රු 600000
   ශුද්ධ ලාභය රු 300000
   විකුණුම් මිලට 20% දළ ලාභ ප්‍රතිශතයක් සහිතව විකුණුම් සිදු කරනු ලැබේ.
   පහත දෑ ගණනය කරන්න.
   1. විකුණුම් පිරිවැය : ..........................................................................
   2. විකුණුම් ආදායම : ..........................................................................
   3. මෙහෙයුම් වියදම : ..........................................................................

37. පහත තොරතුරු 2019.03.31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන සමාගමකට අදාල වේ.
   2018.10.01 දින බෙදාහැරීමේ වෑන් රථයේ වාර්ෂික රක්ෂණ වාරිකය රු. 80000 ගෙවන ලදී.
   2019.01.01 දින මාස 06 ගොඩනැගිලි බදු කුලිය ලෙස රු. 36000 ගෙවන ලදී.
   1. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගන්නා වියදම ..........................................................................
   2. 2019.03.31 දිනට ජංගම වත්කම් ..........................................................................

38. ව්‍යාපාරයක සිදුවූ පහත දැක්වෙන එක් එක් ගණුදෙනුව වාර්තා කිරීමට අදාල ගිණුම් වර්ග දෙක ✓ මගින් නිරූපනය කරන්න.

| ගණුදෙනුව | වත්කම් | වගකීම් | හිමිකම් | අදායම් | වියදම් |
|---|---|---|---|---|---|
| 1. අත්පිට ගැනුම් | .......... | .......... | .......... | .......... | .......... |
| 2. ආපසු යැවුම් | .......... | .......... | .......... | .......... | .......... |
| 3. බොල් ණය කපා හැරීම | .......... | .......... | .......... | .......... | .......... |
| 4. වැටුප් ගෙවීම් | .......... | .......... | .......... | .......... | .......... |

39. අමල් තිලක් රුවන් හවුල් ව්‍යාපාරය

| | **2018.04.01 දිනට** | **2019.03.31 දිනට** |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම (රු.000) | | |
| අමල් | 3000 | 3000 |
| තිලක් | 2500 | - |
| රුවන් | 2000 | 1700 |

   වෙනත් තොරතුරු
   1. අමල්, තිලක්, රුවන් ලාභා ලාභ 2:1:1 අනුපාතයට බෙදා ගනී.
   2. 2019. 03. 31 තිලක් විශ්‍රාම ගන්නා ලදී. එදින සිට අමල් සහ රුවන් ලාභ අලාභ සමසමව බෙදා ගනිමින් ව්‍යාපාරය කරගෙන යන ලදී.
   3. තිලක් විශ්‍රාම ගිය දින කීර්තිනාමය ගිණුම් ගත කර ඇත.
   හවුල් ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය ගණනය කරන්න. ..........................................................................

40. ව්‍යාපාර ආයතනයකට අදාළ තොරතුරු

| | |
|---|---|
| 2019.03.01 දිනට ප්‍රාග්ධන ගිණුම | 150000 |
| රඳවාගත් ඉපැයුම් ගිණුම | 30000 |
| ජංගම වගකීම් | 40000 |
| ජංගම වත්කම් | 100000 |

   මාර්තු මාසයේදී සිදුවූ ගණුදෙනු
   1. බඩු තොග ණයට මිලදී ගැණුම් රු 20000
   2. ණය ගැතියන්ගෙන් ලද මුදල 15000
   දුන් වට්ටම 1000

2019. 03. 31 දිනට පහත දෑ ගණය කරන්න.
   රඳවාගත් ඉපැයුම් ..........................................
   ජංගම වත්කම් ..........................................
   ජංගම වගකීම් ..........................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 12, End Year Test, July 2019**

# ගිණුම්කරණය - II
# Accounting - II

33 | S | II

පැය 02 යි. මි. 30
Two hours. 30 min.

- ♦ පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- ♦ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- ♦ අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

01. අරුණ බිමල් චතුර හවුල් ව්‍යාපාරයක යෙදී සිටි හවුල් ගිවිසුම
ලාභ අලාභ අරුණ බිමල් චතුර අතර 2:2:1 අනුපාතයට බෙදාගත යුතුය.
ආරම්භක ප්‍රාග්ධනය ශේෂය මත 10% බැගින් පොලි හිමි වේ.
අරුණට රු 20 000 ක් බිමල්ට රු 15 000 ක් චතුරට රු 25 000 ක් ද බැගින් මාසික වේතන හිමි වේ.

2019.03.31 දිනට ශේෂය පිරික්සුම (රු 000)

| | | හර | බැර |
|---|---|---|---|
| විකුණුම් | | | 12800 |
| ගැණුම් | | 6900 | |
| 2018.04.01 තොගය | | 610 | |
| බෙදා හැරීමේ වියදම් | | 1400 | |
| පරිපාලන වියදම් | | 1820 | |
| 10% ණය ගිණුම - අරුණ | | | 1500 |
| අරුණට ගෙවූ පොලී | | 100 | |
| 2018.04.01 දිනට දේපල පිරියත හා උපකරණ ධාරණ අගය | | 7300 | |
| ගැනිලි | අරුණ | 160 | |
| | බිමල් | 210 | |
| ප්‍රාග්ධන ගිණුම් | අරුණ | | 3000 |
| | බිමල් | | 2800 |
| | චතුර | | 2000 |
| 2018.04.01 දිනට ජංගම ගිණුම | අරුණ | | 360 |
| | බිමල් | | 410 |
| | චතුර | | 270 |
| වෙළඳ ණයගැතියෝ | | 2100 | |
| වෙළඳ ණය හිමියෝ | | | 800 |
| 2019.03.31 දිනට උපචිත පරිපාලන වියදම් (දුරකථන ගාස්තු) | | | 30 |
| බැංකු ශේෂය | | 3370 | |
| | | 23970 | 23970 |

වෙනත් තොරතුරු

1. 2019.03.31 දිනට ඉතිරි තොගය රු 720 000
2. 2018.04.01 දිනට දේපල පිරියත හා උපකරණවල සංයුතිය

| | පිරිවැය | 2018.04.01 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|
| ගොඩනැගිලි | 4 800 000 | 800 000 |
| මෝටර් රථ | 5 200 000 | 1 900 000 |
| | 10 000 000 | 2 700 000 |

දේපල පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

3. පරිපාලන වියදම් තුළ හවුල් කරුවන් ලබාගත් පහත වේතන ඇතුළත් වේ.

| | |
|---|---|
| අරුණ | 80,000 |
| චතුර | 60,000 |

4. බෙදාහැරීමේ වියදම් තුළ ඉදිරි වර්ෂය සඳහා ගෙවන ලද රු 20 000 ප්‍රචාරණ වියදම් ඇතුළත් වී ඇත.
5. 2019.03.31 දිනට පැවති උපචිත දුරකථන ගාස්තු ගිණුම්ගත කර ඇත. මෙම දුරකථන ගාස්තුවලින් රු 10 000 ක් චතුරගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇත. නමුත් මේ පිළිබඳව ගිණුම්වල සටහන් කර නැත.
6. 2019.03.31 දින බිමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදින සිට අරුණ හා චතුර සමානව ලාභ අලාභ බෙදා ගනිමින් ව්‍යාපාරය පවත්වා ගනී.

බිමල් විශ්‍රාම ගැනීමේදී,

- හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු 600 000 තක්සේරු කරන ලදී.
- බිමල්ගේ හිමිකම්වලින් රු 2 000 000 ක් මුදලින් ගෙවන ලදී. එය ගිණුම්ගත කර නැත.
- බිමල්ගේ ඉතිරි හිමිකම ණය ගිණුමට මාරු කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

- ආදායම් ප්‍රකාශනය (ලාභ විසර්ජනය ද සහිතව)
- හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම
- 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 20)

02. සාරංග ඇඳුම් නිෂ්පාදන කර අලෙවි කරන අතර තම නිෂ්පාදන වලට අමතරව නිමි ඇඳුම් මිලදී ගෙන අලෙවි කරනු ලැබේ.

| වත්කම් හා වගකීම් (රු000) | | 2019.01.01 දිනට | 2019. 01. 31 දිනට |
|---|---|---|---|
| බැංකු ශේෂය | | 270 | 5450 |
| **තොග** | රෙදි තොගය | 410 | 730 |
| | නොනිමි තොග | 140 | 120 |
| | නිමි තොගය | 780 | 690 |
| වෙළඳ ණය ගැතියෝ | | 660 | 780 |
| යන්ත්‍ර සූත්‍ර ධාරණ අගය | | 1500 | 1400 |
| බෙදාහැරීමේ රථ ධාරණ අගය | | 1300 | 1150 |
| වෙළඳ ණය හිමියන් | | 920 | ? |
| උපචිත විදුලි ගාස්තු (කර්මාන්ත ශාලාව) | | 10 | 20 |

**2019 ජනවාරි මාසය තුළදී කරන ලද ගනුදෙනු**

**සැපයුම් කරුවන්ගෙන් ණයට ලබාගත් ද්‍රව්‍ය**

| | |
|---|---|
| රෙදි තොග ණයට ගැණුම් | 3 320 000 |
| නිමි ඇඳුම් ණයට ගැණුම් | 480 000 |
| වක්‍ර අමුද්‍රව්‍ය ඉන්වොයිස් මිල රු. | 620 000 |
| අඩුකල වෙළඳ වට්ටම | 20 000 |
| ආපසු යවන ලද රෙදි තොග | 210 000 |

**ජනවාරි මාසයේ මුදල් ගනුදෙනු**

| | |
|---|---|
| මුදල් ලැබීම් | |
| අත්පිට විකුණුම් | 3 800 000 |
| ණයගැති ලැබීම | 5 300 000 |
| මුදල් ගෙවීම් | |
| විදුලි ගාස්තු - කර්මාන්ත ශාලාවට | 70 000 |
| කාර්යාලයට | 40 000 |
| කර්මාන්ත ශාලා බදු කුලී (මාසික) | 360 000 |
| සේවක වැටුප් | |
| නිෂ්පාදන සේවකයන් | 1 200 000 |
| නිෂ්පාදන සුපරීක්ෂක | 100 000 |

| | |
|---|---|
| කාර්යාලීය සේවක | 300 000 |
| යන්ත්‍ර මිලට ගැනුම් | 200 000 |
| වෙළඳ ණය හිමියන්ට ගෙවීම් | 1 620 000 |
| ලද වට්ටම් | 90 000 |
| ගෙන ඒමේ කුලී - නිමි ඇඳුම් | 30 000 |

**අවශ්‍ය වන්නේ,**

1. ණයහිමි පාලන ගිණුම
2. නිෂ්පාදන පිරිවැය ලේඛනය
3. ආදායම් ප්‍රකාශනය
4. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ජංගම වත්කම්

(ආ) තරංගගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසය සඳහා ලැබුණු බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2019.03.01 | ශේෂය | | | 560 |
| 2019.03.03 | චෙක් අංකය 012 | | 200 | 760 |
| 2019.03.05 | චෙක් අංකය 312 | | 150 | 910 |
| 2019.03.12 | චෙක් අංකය 601 | 240 | | 670 |
| 2019.03.15 | චෙක් අංකය 602 | 330 | | 340 |
| 2019.03.31 | බැංකු ගාස්තු | 30 | | 310 |
| 2019.03.31 | ලැබු ලාභාංශය | | 70 | 380 |

වෙනත් තොරතුරු

| | | |
|---|---|---|
| ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | අංකය 603 | 300 |
| උපලබ්ධි නොවූ චෙක් | අංකය 813 | 250 |

අවශ්‍ය වන්නේ,

1. බැංකු සැසඳුම් ප්‍රකාශය
2. සංශෝධිත මුදල් ගිණුම
3. මුදල් පාලන ගිණුමට අදාළව ජනවාරි මස මුළු මුදල් ලැබීම් හා ගෙවීම (ල.5)

03. භාණ්ඩ බෙදාහරින ව්‍යාපාරයක් පොත්වලින් 2019 ජනවාරි මාසයට අදාළව උපුටාගත් තොරතුරු (VAT බදු සඳහා ලියාපදිංචි ආයතනයකි)

ණයගැති ලෙජරයේ උපුටා ගත් තොරතුරු (000)

| ණයගැතියාගේ නම | 2019.01.01 ශේෂය | VATරහිත විකුණුම් මිල | විකුණුම් මත +VAT බදු | ආපසු එවුම් විකුණුම් මිල | VAT බදු | වෙළඳ වට්ටම් |
|---|---|---|---|---|---|---|
| සුපුන් | 960 | 800 | 80 | - | - | |
| අකිල | - | 1300 | 130 | 200 | 20 | |
| දමිත් | 360 | 750 | - | 150 | - | |
| ඩිලාන් | - | 930 | - | - | - | 30 |
| | 1320 | 3780 | 210 | 350 | 20 | 30 |

ඩිලාන් 2018.12.26 වන දින භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.1500 000 අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි ඒ වෙනුවෙන් 2019 ජනවාරි මාසයේදී සපයන ලද භාණ්ඩ ණයට විකුණුම් ලෙස වාර්තා කර තිබිණි.

2019.01.01 දිනට පැවති වත්කම් හා වගකීම්

| | |
|---|---|
| කාර්යාලයීය උපකරණවල ධාරණ අගය | 1 600 000 |
| වෙළඳ තොගය | 960 000 |
| වෙළඳ ණයගැතියෝ | 132 000 |
| වෙළඳ ණය හිමියෝ | 90 000 |
| ලැබූ අත්තිකාරම් (ඩිලාන්ගේ) | 1 500 000 |
| බැංකු ගිණුම් ශේෂය | 1 200 000 |

**2019 ජනවාරි මස සිදු වූ ගනුදෙනු**

ව්‍යාපාරයේ පැවති රු.70 000 ක ධාරණ අගයක් සහිත කාර්යාලීය උපකරණ රු.60 000 කට අත්පිට විකුණන ලදී.

| | | |
|---|---|---|
| සුපුන්ගෙන් ලද චෙක්පත්‍රය 970 000 | දුන් වට්ටම් | 20 000 |
| අකිලගෙන් මුදල් ලැබීම රු 500 000 | | |
| දමිත්ගෙන් ලද චෙක් පත්‍රය 800 000 | දුන් වට්ටම් | 10 000 |

අත්පිට මුදලට විකුණුම් 2720 000
අත්පිට මුදලට ගැණුම් 2200 000
සේවක වැටුප් 300 000
ප්‍රචාරණ වියදම් 200 000
ණය හිමි ගෙවීම් 210 000

වෙනත් තොරතුරු
ප්‍රචාරණ වියදම් සඳහා නිකුත් කළ චෙක් පත්‍රය අගරු විය.
දමිත්ගෙන් ලද චෙක් පත්‍ර අගරු විය.

අවශ්‍ය වන්නේ,
මුදල් ලැබීම් ජ'නලය
ණයගැති පාලන ගිණුම
මුදල් පාලන ගිණුම
කාර්යාලීය උපකරණ ඉවත් කිරීමේ ගිණුම
VAT බදු පාලන ගිණුම
විකුණුම් ගිණුම ආපසු එවුම් ගිණුම
ප්‍රචාරණ වියදම් ගිණුම (ල.15)

(ආ) ව්‍යාපාර ආයතනය ගිණුම් වර්ෂය 2019.03.31 දිනෙන් අවසන් වේ. ගිණුම් තැබීමේදී පහත වැරදි සිදු වී ඇති බව අනාවරණය විය.

1. රු 1500 ක වැටුප් මුදලින් ගෙවා ඇත, එය වැටුප් ගිණුමට රු 150 ක් ලෙස සටහන් කර ඇත.
2. මුදල් ලැබීම් ජ'නලයේ දුන් වට්ටම් තීරුවේ එකතුව වූ රු.800 ණයගැති පාලන ගිණුමට හර කර ඇත.
3. ණයට මිලදී ගත් රු 12000 ක කාර්යාලීය උපකරණ ගැනුම් ජ'නලයේ වාර්තා කර ලෙජරයට පිටපත් කර ඇත.
4. මුදල් ගෙවීම් ජ'නලයේ වියදම් ගෙවීම් තීරුව රු. 1000 වැඩියෙන් එකතු කර ඇත.
5. කොමිස් සඳහා ලැබුනු රු. 2400 ක චෙක් පත බැංකුව අගරු කර ඇත. මෙය ගිණුම්ගත කර නැත.

**ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් ලියන්න.**

04. (අ) සුපුන් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2019 ජනවාරි මාසයේදී කරන ලද ගණුදෙනු

| **ගනුදෙනු අංකය** | **ගනුදෙනුව** |
|---|---|
| 01 | රු 90 000 ක පිරිවැය වූ තොග රු 150 000 ක අත්පිට විකිණීම් |
| 02 | රු 80000 තොග ණයට මිලදී ගෙන ඇත. |
| 03 | ජනවාරි මාසයේ වැටුප් වියදම රු 25 000 ක් වූ අතර රු. 20 000 ක වැටුප් මුදලින් ගෙවා ඇත. |
| 04 | රු 60 000 පිරිවැය වූ තොග රු 50 000 කට ණයට විකිණීම |
| 05 | චෙක් පතක් ලියා රු 15 000 ක රක්ෂණ ගාස්තුවක් සුපුන්ගේ පෞද්ගලික මෝටර් රථය සඳහා ගෙවා ඇත. |
| 06 | ආපසු එවුම් රු 10 000 ක් අතර එහි පිරිවැය රු 12 000 කි |
| 07 | 2019.01.01 දිනට පැවති වෙළඳ ණය ගැතියන් මුදල් ලැබුණ අතර අඩුකල දුන් වට්ටම 5% කි. |
| 08 | වෙළඳ ණය හිමියන්ට ගෙවූ මුදල රු 75 000 |
| 09 | 2019.01.01 දින ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දුන් අතර මාස 03 ක කුලී ලෙස රු 45 000 ක් ලැබී ඇත. |
| 10 | රු 200 000 මෝටර් රථයක් මිලදී ගත් අතර ඒ සඳහා රු 150 000 ක් ගෙවා ඇත. |

වෙනත් තොරතුරු
1. 2019.01.31 දිනට වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ අලාභ ඉඩහැරීම් රු 10 000
2. රු 80 000 ක පිරිවැය වූ තොග ජනවාරි මාසය තුළදී හානියට පත් වී ඇත. ඒ වෙනුවෙන් රු 60 000 ක රක්ෂණ වන්දිය ලැබීමට ඇත.
3. ණයගැති සෘජු ප්‍රේෂණ රු 30 000 කි.
4. දේපල පිරියත හා උපකරණවල වාර්ෂික ක්ෂය වීම් රු 240 000 කි.

අවශ්‍ය වන්නේ,

01. පහත ආකෘතිය භාවිතා කරමින් ඉහත අංක 01 සිට 10 දක්වා ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණයට ආදේශ කරන්න. (රු.000)

| ගණුදෙනු අංකය 2019.01.01 | වත්කම් | | | | හිමිකම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත හා උපකරණ | තොග | ණයගැතියන් | බැංකු | ප්‍රාග්ධන | රදවාගත් | වෙළඳ ණය ඉපයුම් | වෙනත් ණය |
| ශේෂය | 2000 | 600 | 800 | 1600 | 3600 | 900 | 500 | - |

02. අංක 1 සිට 10 දක්වා ගණුදෙනු මගින් ඇතිවන ශුද්ධ ලාභය ගණනය කරන්න.(හිමිකම් වෙනස් වීමේ පදනම)

03. ඉහත අතිරේක තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසු නිවැරදි ශුද්ධ ලාභය. (ලකුණු 15)

(ආ) සම්පත්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

2019.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් ලබාගත් තොරතුරු (රු.000)

| | | |
|---|---|---|
| වත්කම් | ජංගම නොවන වත්කම් | 9000 |
| | ජංගම වත්කම් | 3000 |
| හිමිකම් හා වගකීම් | | |
| | ප්‍රාග්ධනය | 7500 |
| | රඳවාගත් ඉපයුම් | 2500 |
| | ජංගම වගකීම් | 2000 |

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පහත ගැලපිලි සටහන් ගිණුම් ගත කර නැත.

1. 2019.03.31 දිනට පැවති ඉතිරි තොගය රු 40 000 කින් අධි තක්සේරු වී ඇත.
2. සේවක අර්ථ සාධක අරමුදලට රු 20 000 ක් අඩුකර ගෙන වැටුප ගෙවා ඇත. ශුද්ධ වැටුප වියදම් ලෙස හඳුනාගෙන ඇත. පොත්වල වාර්තා නොවූ අර්ථ සාධක වියදම රු 30 000
3. ප්‍රචාරක කටයුතු සඳහා නොමිලේ බෙදා හරින ලද තොගවල පිරිවැය රු 60 000 කි. මෙය ගිණුම් ගත කර නැත.
4. රු 50 000 වෙළඳ තොග ණයට මිලදී ගෙන තිබූ අතර ඒ පිළිබඳ ගැනුම් ජ'නලයේ හා ලෙජරයේ සටහන් තබා නැත.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත වැරදි නිවැරදි කළ පසු ශුද්ධ ලාභයේ ඇතිවන වැඩිවීම හෝ අඩුවීම ගණනය කරන්න.
2. 2019.03.31 දිනට ජංගම වගකීම්.
3. අංක 01 සහ 02 ගැලපිලි වාර්තා කිරීමේ ජනල් සටහන් (ලකුණු 05)

05. ළහිරු ක්‍රීඩා සමාජයේ පොත්වලින් උපුටා ගත් තොරතුරු

1. 2018.04.01 දිනට ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව

| | |
|---|---|
| යාවජීව සාමාජිකයන් | 30 |
| අනෙකුත් සාමාජිකයන් | 270 |
| | 300 |

2016.04.01 දින යාවජීව සාමාජිකයින් වර්ෂ 10 ක් සඳහා සාමාජික මුදල් එකවර ගෙවා සාමාජිකත්වය හිමිකරගෙන ඇත.

**මාසික සාමාජික ගාස්තුව රු.100**

| 2. සමිතිය සතුව පැවති වත්කම් හා වගකීම් (රු000) | 2018.04.01 දිනට | 2019.03.31 දිනට |
|---|---|---|
| හිඟ සාමාජික මුදල | 20 | 30 |
| කලින් ලද සාමාජික මුදල | 10 | 30 |
| යාවජීව සාමාජික මුදල් ගිණුම | 288 | 252 |
| ක්‍රීඩා භූමිය | 3000 | 3000 |
| ක්‍රීඩා උපකරණ | 300 | ? |
| බැංකු ශේෂය | 150 | ? |

3. ක්‍රීඩා සමාජයට මුදල් උපයා ගැනීම සඳහා 2019.03.15 දින නාට්‍ය සංදර්ශනයක් පවත්වන ලදී. ඒ සම්බන්ධ ගනුදෙනු

| ප්‍රවේශපත්‍ර වටිනාකම | අලෙවි කළ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව | ලැබුණු මුදල |
|---|---|---|
| රු 1000 | 600 | 58000 |
| රු 500 | 1000 | 49000 |

සුභ පතන්නන් විසින් නාට්‍ය සංදර්ශනය සඳහා රු.120 000 ක අනුග්‍රාහක දායකත්වයක් ලබා දී ඇත.

නාට්‍ය සංදර්ශනයේ වියදම

| | |
|---|---|
| ප්‍රචාරන වියදම | 30 000 |
| ප්‍රවේශ පත්‍ර මුද්‍රණයට | 15 000 |
| නාට්‍ය ශිල්පීන්ට ගෙවීම් | 500 000 |

4. පරිත්‍යාග ලැබීම්

2018.04.01 දින රු 160 000 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් ක්‍රීඩා සමාජයේ භාවිතය සඳහා ලැබී ඇත. එය වර්ෂ 4 ක ආදායම් ලෙස හඳුනා ගනී.

නව ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා 2018.09.01 දින රු 400 000 ක පරිත්‍යාග මුදලක් ලැබී ඇත. එය එදිනම ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කරන ලදී. වාර්ෂික පොලී අනුපාතය 12%

**ක්‍රීඩා සමාජයේ අනෙකුත් ගනුදෙනු**

| | |
|---|---|
| ක්‍රීඩා පිටිය බාහිර පරිහරණයට දීමෙන් උපයාගත් මුදල | 240 000 |
| ඇතුළත්වීමේ ගාස්තු | 20 000 |

| | |
|---|---|
| කාර්යාලයේ සේවක වැටුප් | 84 000 |
| කාර්යාලයීය විදුලි ගාස්තු | 35 000 |

**අවශ්‍ය වන්නේ,**

1. මුදල් සාරාංශය
2. නාට්‍ය සංදර්ශනයේ ආදායම් ප්‍රකාශන
3. ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශන
4. 2019.03.31 දිනට සමුච්චිත අරමුදල
5. 2019.03.31 දිනට හිමිකම් (ලකුණු 15)

(ආ) අරුණගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු.6 000කි. 2019.01.01 දින ප්‍රතිපූර්ණය කල අග්‍රිමය 5 600 කි.

2019 ජනවාරි මාසයේදී කරන ලද සුළු මුදල් ගෙවීම්

| දිනය | ගෙවීම් | ගණුදෙනුව | |
|---|---|---|---|
| 2019.01.01 | වවුචර් අංකය | | |
| 2019.01.01 | 031 | CR පොත් මිලදී ගැනීමට | රු.400 |
| 2019.01.06 | 032 | බස් රථ ගාස්තු ගෙවීම් | රු.450 |
| 2019.01.10 | 033 | කාබන් පෑන් මිලදී ගැනීම | රු.580 |
| 2019.01.15 | 034 | දුම්රිය ප්‍රවේශපත්‍ර සඳහා | රු.350 |
| 2019.01.18 | 035 | දිවා ආහාර මිලදී ගැනීම | රු.750 |
| 2019.01.20 | 036 | සිසිල් බීම මිලදී ගැනීම | රු.760 |
| 2019.01.21 | 037 | ජංගම දුරකථන ගාස්තු | රු.800 |
| 2019.01.25 | 038 | මුද්දර මිලදී ගැනීම | රු.690 |
| 2019.01.27 | 039 | වැටුප් අත්තිකාරම් ගෙවීම | රු.500 |
| 2019.01.31 | 040 | පුතාගේ උපකාරක පන්ති ගාස්තු | රු.700 |

අවශ්‍ය වන්නේ,

1. සුළු මුදල් ගෙවීම් ජ,නලය

2.සුළු මදුල් පාලනය (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, End Year Test, July 2019**

ගිණුම්කරණය / **Accounting** — 33 S I,II — පිළිතුරු / **Answers**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| (1) 3 | (2) 5 | (3) 4 | (4) 5 | (5) 1 |
| (6) 2 | (7) 1 | (8) 4 | (9) 3 | (10) 4 |
| (11) 2 | (12) 2 | (13) 5 | (14) 3 | (15) 2 |
| (16) 5 | (17) 4 | (18) 5 | (19) 3 | (20) 1 |
| (21) 2 | (22) 3 | (23) 4 | (24) 2 | (25) 3 |

26. 1. අතීත තොරතුරු, අතීත හා පුරෝකථනය කරන ලද තොරතුරු ②
    2. අභ්‍යන්තර හා බාහිර — අභ්‍යන්තර පර්ශවය (කළමණාකරුවන්) ②

27. 1. රු. 500 ක ගැනිලි ලබාගැනීම
    2. රු. 1000ක කාර්යාලීය උපකරණ අත්පිට මිල දී ගැනීම
    3. උපචිත විදුලි ගාස්තු රු. 200ක ④

28. 1. සත්‍යයි
    2. අසත්‍යයි
    3. අසත්‍යයි
    4. අසත්‍යයි ④

29. 1. ගැලපුම් සංකල්පය
    2. සාපේක්ෂ වැදගත්කම ප්‍රමාණාත්මක බව
    3. ආදායම් හඳුනාගැනීමේ සංකල්පය ④
    4. ඒකක සංකල්පය

30. සෘජු ප්‍රේෂණ
    නිකුත් කළ ගිණුමට හර නොවූ චෙක්
    නිකුත්තළ අගරු වූ චෙක්පත් ④
    ලැබූ ලාභාංශ ලැබූ පොලී

31. 1. ඉතිරි තොගය ගැලපීම
    2. විනාශ වූ තොග ④
    3. පරිත්‍යාග කරන ලද තොග
    4. භාණ්ඩ ගැනිලි

32. සෘජු, සෘජු, සෘජු

33. i. 3000 ② ii. 3900 ①

34.

| | |
|---|---|
| අමු ද්‍රව්‍ය ගැනුම් | 3900 |
| 2018.04.01 ණයහිමි | 720 ① |
| | 4620 |
| (-) 2019-03-31 ණයහිමි | (630) ① |
| | 3990 ① |

35. i. විනාශ වූ තොග ගිණුම හර 30 000
    වෙළෙඳ ගිණුම/ විකුණුම් පිරිවැය ② 30 000
    ii. තොග හානි අලාභ ගිණුම හර 5 000
    විනාශ වූ තොග ගිණුම ② 5 000

36. i. 2 400 000② ii. 3000 000 ① iii. 300 000 ①

37. i.

| | |
|---|---|
| රක්ෂණය | 40 000 ① |
| බදු කුලී | 18 000 ① |
| | 58 000 |

ii.

| | |
|---|---|
| ජංගම වත්කම් රක්ෂණය | 40 000 ① |
| බදු කුලී | 18 000 ① |
| | 58 000 |

38.

| | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|---|
| 1 | ✓ | | | | ✓ |
| 2 | | ✓ | | | ✓ |
| 3 | ✓ | | | | ✓ |
| 4 | ✓ | | | | ✓ |

39. $\overbrace{300 \times 2}^{②} = 600$ ②

40.

| | |
|---|---|
| රඳවාගත් ඉපයුම් | 29 000 ② |
| ජංගම වත්කම් | 119 000 ① |
| ජංගම වගකීම් | 60 000 ① |

## II කොටස

අරුණ බිමල් චතුර හවුල් ව්‍යාපාරයේ 2019.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය ①
(ලාභ විසර්ජනය සහිතව)

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම | | | 12800 |
| විකුණුම් පිරිවැය | | | |
| 2018.04.01 තොගය | | 610 ① | |
| ගැනුම් | | 6900 | |
| | | 7510 | |
| 2019.03.31 තොගය | | (720) ① | |
| | | | (6790) |
| දළ ලාභය | | | 6010 ① |
| වියදම් | | | |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | | 1000 ① | |
| පරිකල්පන වියදම් | | 1680 ① | |
| බෙදාහැරීම් වියදම් | | 1380 ① | |
| ණය පොලී | | 150 ① | |
| | | | (4210) |
| | | | 1800 |
| ලාභ විසර්ජනය | | | |
| ප්‍රාග්ධන පොලී | අරුණ | 300 | |
| | බිමල් | 280 | ② |
| | චතුර | 200 | 780 |
| වේතන | අරුණ | 240 | |
| | බිමල් | 180 | ② |
| | චතුර | 300 | 720 |
| ලාභ කොටස් | අරුණ | 120 | |
| | බිමල් | 120 | ② |
| | චතුර | 160 | 300 |

(ලකුණු 14)

ජංගම ගිණුම

| විස්තරය | අරුණ | බිමල් | චතුර | විස්තරය | අරුණ | බිමල් | චතුර |
|---|---|---|---|---|---|---|---|
| වේතන | 80 ① | - | 60 | ශේෂය | 360 | 410 | 270 |
| ගෙවූ ණය පොලී | 100 ① | | | ප්‍රාග්ධන පොලී ① | 300 | 280 | 200 |
| ගැනිලි | 160 | 210 ① | - | වේතන ① | 240 | 180 | 300 |
| ප්‍රාග්ධන ගිණුම | | 780 ① | - | දුරකථන ගාස්තු ① | | | 10 |
| | | | | ණය පොලී ① | 150 | 120 | 60 |
| ශේ/ප/ගෙ | 830 | - | 780 | ලාභාංශ ① | 120 | 120 | 60 |
| | 1170 | 990 | 840 | | 1170 | 990 | 840 |
| | | | | ශේ/ඉ/ගෙ | 830 | - | 780 |

(ලකුණු 9)

ප්‍රාග්ධන ගිණුම

| විස්තරය | අරුණ | බිමල් | චතුර | විස්තරය | අරුණ | බිමල් | චතුර |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | 300 | ① - | 300 | ශේෂය | 3000 | 2800 | 2000 |
| මුදල | - | 2000 | ① - | කීර්තිනාමය | 240 | ① 240 | 120 |
| ණය ගිණුමට | - | 1820 | ① - | ජංගම ගිණුම | - | ① 780 | - |
| ශේ/ප/ගෙ | 2940 | - | 1820 | | | | |
| | 3240 | 3820 | 2120 | | 3240 | 3820 | 2120 |

(ලකුණු 05)

අරුණ චතුර හවුල් ව්‍යාපාරයේ
2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | පිරිවැය | | සමුච්චිත ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | | 10000 ① | | 3700 ① | 6300 |
| ජංගම වත්කම් | | | | | |
| තොගය | | 720 ① | | | |
| ණයගැතියෝ | | 2100 | | | |
| ඉදිරියට ගෙවූ ප්‍රචාරණය | | 20 ① | | | |
| බැංකු ශේෂය | | 1370 ① | | | |
| | | | 4210 | | |
| | | | 10510 | | |
| හිමිකම් | | | | | |
| ප්‍රාග්ධන ගිණුම | අරුණ | 2940 ① | | | |
| | චතුර | 1820 ① | | | |
| ජංගම ගිණුම් | | | 4760 | | |
| | අරුණ | 830 ① | | | |
| | චතුර | 780 ① | | | |
| | | | 1610 | | |
| ජංගම නොවන වගකීම් | | | | | |
| ණය ගිණුම | අරුණ | 1500 ① | | | |
| | බිමල් | 1820 ① | | | |
| | | | 3320 | | |
| ජංගම වත්කම් | | | | | |
| උපචිත විශ්ලේෂණ වියදම් | | 20 ① | | | |
| ණය හිමියෝ | | 800 | | | |
| | | | 820 | | |
| | | | 10510 | | |

(ලකුණු 12)

02. ණය හිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ආපසු එවුම් | 210 | ශේෂය ① | 920 |
| මුදල් | 1620 | ගැනුම් ① | ① 4400 |
| ලද වට්ටම | 90 ① | | |
| ශේ/ප/ගෙ | 3400 | | |
| | 5320 | | 5320 |

(ලකුණු 04)

නිෂ්පාදන පිරිවැය ලේඛනය

| | | |
|---|---|---|
| 2019.01.01 තොගය | | 410 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 3320 ① | |
| ආපසු යැවුම් | (210) | |
| | | 3110 |
| | | 3520 ① |
| ඉතිරි අමුද්‍රව්‍ය තොගය | | (730) |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | | 2790 |
| සෘජු වියදම් | | |
| සෘජු වැටුප් | | 1200 ① |
| | | 3990 |
| ප්‍රාථමික පිරිවැය ① | | |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | | |
| යන්ත්‍ර ක්ෂය | 300 | ① |
| විදුලි ගාස්තු | 80 | ① |
| කර්මාන්තශාලා බදු කුලී | 30 | ① |
| නිෂ්පාදන සුපරීක්ෂක වැටුප් | 100 | ① |
| වක්‍ර අමුද්‍රව්‍ය | 600 | ① |
| | | 1110 |
| | | 5100 |
| 2019.01.01 නොනිමි තොගය | | 140 ① |
| | | 5240 |
| 2019.01.31 නොනිමි තොගය | | (120) ① |
| මුළු නිෂ්පාදන පිරිවැය ① | | 5120 |

(ලකුණු 12)

2019 ජනවාරි මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 9220 ② |
| විකුණුම් පිරිවැය | | | |
| තොගය | | 780 | |
| නිෂ්පාදන පිරිවැය | | 5120 ① | |
| නිමි භාණ්ඩ ගැනුම් | 480 } ① | | |
| ගෙනඒමේ කුලී | 30 | | |
| | | 510 | |
| | | 6410 | |
| ඉතිරි තොගය | (690) | | |
| | | (5720) | |
| දළ ලාභය | ① | 3500 | |
| ලද වට්ටම් | | 90 ① | |
| | | 3590 | |
| බෙදා හැරීමේ රථ ක්ෂය | 150 ① | | |
| විදුලි ගාස්තු- | 40 ① | | |
| කාර්යාලීය සේවක වැටුප් | 300 ① | | |
| | | 490 | |
| ශුද්ධ ලාභය | | 3100 | |

ජංගම වත්කම්

| | |
|---|---|
| තොග අමුද්‍රව්‍ය | 730 |
| නොනිමි තොගය ② | 120 |
| නිමි තොගය | 690 |
| ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලී | 330 |
| ණයගැතියෝ ② | 780 |
| බැංකු- ශේෂය | 5440 |

(ලකුණු 04)

පෙර වැඩ

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය | 660 | මුදල | 5300 |
| විකුණුම් | 5420 | ① | |
| | | පා/ශේ | 780 |
| | 6080 | | 6080 |
| ඉ/ගේ ශේෂය | 780 | | |

විකුණුම්

| | |
|---|---|
| මුදලට | 3800 |
| ණයට | 5420 |
| | 9220 |

02. (ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය (රු000)

| | | | |
|---|---|---|---|
| බැංකු ගිණුම් ප්‍රකාශනය අනුව ශේෂය | | | 380 |
| +උපලබ්දි නොවූ චෙක් | 813 | ① | 250 |
| | | | 630 |
| (-) නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් 603 | | ① | 300 |
| මුදල් පොතට අනුව බැංකු ශේෂය | | | 330 ① |

හෝ

බැංකු සැසඳුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| මුදල් පොතට දැනුම බැංකු ශේෂය | ① | 330 |
| +නිකුත් කළ ගිණුමට හර නොවූ චෙක් 603 | ① | 300 |
| | | 630 |
| (-) උපලබ්දි නොවූ චෙක් 813 | ① | (250) |
| බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | | 380 |

මුදල් පොත නිවැරදි කිරීමට (000)

| | | | |
|---|---|---|---|
| 3 - 31 ශේෂය | ① 290 | බැංකු ගාස්තු | ① 30 |
| ලැබූ ලාභාංශ | ① 70 | | |
| | | ශේෂය ප/ගෙ/ගි | 330 |
| | 360 | | 360 |
| ශේ/ඉ/ගෙ | 330 | | |

මාර්තු මස මුදල් ලැබීම් (රු.000)

| | | |
|---|---|---|
| 012 චෙක් | 200 | } ① |
| 312 චෙක් | 150 | |
| ලාභාංශ | 70 | } ① |
| උපලබ්දි නොවූ චෙක් 813 | 250 | |
| | 670 | |

මාර්තු මස මුදල් ගෙවීම් (රු000)

| | | |
|---|---|---|
| චෙක් අංකය 601 | 240 | } ① |
| 602 | 330 | |
| බැංකු ගාස්තු | 30 | } ① |
| ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | 300 | |
| | 900 | |

(ලකුණු 10)

03. මුදල් ලැබීම් ජ'නලය (රු000)

| දිනය | විස්තරය | දුන් වට්ටම | මුදල | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| - | සුපුන්ගෙන් | 20 | 970 | | 970 ① | | |
| - | අකිලගෙන් | | 500 | | 500 ① | | |
| | දමිත් | 10 | 800 | | 800 ① | | |
| | අත්පිට විකුණුම් | | 2720 | 2720 | ① | | |
| | කාර්යාල උපකරණ විකුණුම් | | 600 | | | ① | 600 |
| | ලැබූ කොමිස් | | 60 | | | 60 | ① |
| | | 30 | 5650 | 2720 | 2270 | 60 | 600 |
| | | ① | | | | | |

(ලකුණු 07)

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| 01.01 ශේෂය | 1320 | ආපසු එවුම් | 350 ① |
| විකුණුම් | 2850 ① | VAT බදු පාලන | 20 ① |
| VAT බදු | 210 ① | මුදල් පාලනය | 2270 ① |
| අගරු වූ චෙක් පත් | 800 ① | දුන් වට්ටම් | 30 ① |
| දුන් වට්ටම් | 10 ① | | |
| | | ශේ/ප/ගෙ | 2520 |
| | 5190 | | 5190 |

(ලකුණු 08)

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| 01. 01 ශේෂය | 1200 | ගැණුම් | 2200 |
| විකුණුම් | 2720 | වියදම් ගෙවීම | 500 |
| ණයගැති පාලන | 2270 | ණයහිමි ගෙවීම් | 2100 |
| වෙනත් ආදායම් | 60 | ණයගැති පාලන දමිත් | 800 |
| වෙනත් ලැබීම් | 600 | | |
| උපචිත ප්‍රචාරණ | 200 | ශෙ/ප/ගෙ | 1450 |
| | 7050 | | 7050 |

(අයිතම 2 කට ලකු-ණු 1

බැගින් ල. 05)

VAT පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන | ① 20 | ණයගැති පාලන ① | 210 |
| ණයහිමි පාලන | ① 260 | | |
| | | ශෙ/ප/ගෙ | 70 |
| | 280 | | 280 |
| ශේ/ඉ/ගෙ | 70 | | |

6470

කාර්යාලයීය උපකරණ ඉවත් කිරීමේ ගිණුම

| | | | |
|---|---|---|---|
| කාර්යාලයීය උපකරණ | 700 | මුදල් පාලන ① | 600 |
| | | අලාභය ① | 100 |
| | 700 | | 700 |

විකුණුම් ගිණුම ①

| | | | |
|---|---|---|---|
| | | මුදල් පාලන | 5200 |
| | | ලැබූ අත්තිකාරම් | 900 ① |
| | | ණයගැති පාලන | 2850 ① |
| ශෙ/ප/ගෙ | 6470 | | |
| | 6470 | | 6470 |

ආපසු එවුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ① ණය ගැති පාලන | 350 | | |

ප්‍රචාරණ වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් පාලන | 200 | | |

ලැබූ අත්තිකාරම් ගිණුම

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 900 | ශේෂය | 1500 ① |

(ලකුණු 10)

03. (ආ) **පොදු ජ්නලය**

| | හර | | බැර |
|---|---|---|---|
| (1) වැටුප් ගිණුම හර | 1350 | ② | |
| අවිනිශ්චිත ගිණුම | | | 1350 |
| වැටුප් ගිණුමට පිටපත් නොවූ අගය සටහන් කිරීම. | | | |
| (2) (i) ණය හිමි පාලන ගිණුම හර | 12000 | ② | |
| ගැනුම් ගිණුම | | | 12000 |
| ගැනුම් ජනලයේ සටහන් කර තිබූ කාර්යාලීය උපකරණ ගැනුම් නිවැරදි කිරීම | | | |
| (ii) කාර්යාලීය උපකරණ ගිණුම හර | 12000 | ② | |
| දම්රෝ සමාගමේ ගිණුම | | | 12000 |
| ණයට ගත් කාර්යාලීය උපකරණ සටහන් කිරීම. | | | |
| (iii) මුදල් පාලන ගිණුම හර | 1000 | ② | |
| අවිනිශ්චිත ගිණුම | | | 1000 |
| මුදල් පාලන ගිණුමේ වැඩියෙන් සටහන් වූ වියදම් නිවැරදි කිරීම | | | |
| (iv) ලැබිය යුතු කොමිස් ගිණුම හර | 2400 | ② | |
| මුදල් පාලන ගිණුම | | | 2400 |
| කොමිස් සඳහා ලැබුණු චෙක් පත අගරු වීම සටහන් කිරීම | | | |

(සංලක්ෂය නොමැති නම් ලකුණු 02 ක් අඩු කරන්න)

04 (අ) (රු 000)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | හිමිකම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේ.වි. උපකරණ | තොග | වෙළඳ ණයගැති | බැංකු ගිණුම | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් | වෙළඳ ණය හිමි | වෙනත් ණය |
| 2019.1.1ශේෂය | 2000 | 600 | 800 | 1600 | 3600 | 900 | 500 | - |
| 01 | | -90 | | +150 | | +60 | ② | |
| 02 | | +80 | | | | | +80 | ② |
| 03 | | | | -20 | | -25 | ③ | +5 |
| 04 | | -60 | +50 | | | -10 | ② | |
| 05 | | | | -15 | | -15 | ② | |
| 06 | | +12 | -10 | | | +2 | ③ | |
| 07 | | | -400 | +380 | | -20 | ③ | |
| 08 | | | | -350 | | | -350 | ② |
| 09 | | | | +45 | | +15 | ③ | +30 |
| 10 | +200 | | | -150 | | | ③ | +50 |
| | 2200 | 542 | 440 | 1640 | 3600 | 907 | 230 | 85 |

(ලකුණු 25)

ගණුදෙනු අංක 01 සිට 10 දක්වා ගනුදෙනු මගින් ඇතිවන ශුද්ධ ලාභය

| | | |
|---|---|---|
| ජනවාරි 31 දිනට රඳවාගත් ඉපැයුම් | | 907 |
| ( - ) ජනවාරි 01 දිනට රඳවාගත් ඉපයුම් ① | | (900) |
| | | 7 |
| ( + ) ගැනිලි | ① | +15 |
| | | 22 |

අංක 01 සිට 10 දක්වා ගනුදෙනු මගින් ඇතිවන ලාභය 22
+

| | | |
|---|---|---|
| - හානි කරන ලද අලාභ ඉඩ හැරීම | (10)① | |
| තොග හානි | (20)① | |
| දේපල පිරියත උපකරණ ක්ෂය | (20)① | |
| | | (50) |
| අලාභය | | (28) |

(ආ) රඳවාගත් ඉපයුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| | | ශේෂය | 2500 |
| ඉතිරි තොගය | 40 ① | | |
| සේවා වැටුප් | 20 ① | | |
| අර්ථසාධක වියදම් | 30 ① | | |
| තොග ණයට ගැණුම් | 50 ① | | |
| | 2360 ① | | |
| | 2500 | | 2500 |

| | | | |
|---|---|---|---|
| ජංගම වත්කම් | 3000 | ජංගම තොග වත්කම් | 9000 |
| තොග අඩුවීම | (40) | | |
| ප්‍රචාරණ සඳහා | 2960 | | |

| | | |
|---|---|---|
| ජංගම වගකීම් | 2000 | ① |
| ගෙවිය යුතු EPF | 50 | |
| වෙළඳ ණය හිමි වැඩිවීම | 50 | |
| | 2100 | |

පොදු ජ'නලය

| | | |
|---|---|---|
| 1. ලාභ ලාභ ගිණුම හර | 40 | |
| ගැණුම් ගිණුම ඉතිරි තොග ගිණුම | | 40 |

ඉතිරි තොගයේ අධි තක්සේරුව නිවරද කිරීම ②

| | | |
|---|---|---|
| 2. ලාභාලාභ ගිණුම වැටුප් | 20 | |
| ලාභාලාභ ගිණුම අර්ථ සාධක වියදම | 30 | |
| ගෙවිය යුතු EPF ගිණුම ② | | 50 |

වාරික ගෙවූ වැටුප් හා ආර්ථ සාධක වියදම් වර්තා කිරීම

(ලකුණු 40)

මුදල් සාරාංශය

| | | | |
|---|---|---|---|
| 2018.04.01 බැංකු ශේෂය | 150 | ප්‍රචාරණය | 30 |
| සාමාජික මුදල ② | 316 | ප්‍රවේශ පත්‍ර මුද්‍රණය | 15 |
| ප්‍රවේශපත්‍ර නාට්‍ය සංදර්ශනය | 1070 | නාට්‍ය ශිල්පීන්ට | 500 |
| නාට්‍ය සන්දර්ශන අනුග්‍රහකත්වය | 120 | ස්ථාවර තැන්පත් | 400 |
| ක්‍රීඩා සංකීර්ණයට පරිත්‍යාග | 400 | කාර්යාල සේවා වැටුප් | 84 |
| ක්‍රීඩා පිටිය කුලියට දීම | 240 | විදුලි ගාස්තු | 35 |
| | | ක්‍රීඩා පිටිය නඩත්තු | 120 |
| | | | 1112 |
| | 2296 | | 2296 |

(ඉතිරි අයිතම 2කට ලකුණු 1 බැගින් ලකුණු 5)
(ලකුණු 07)

සාමාජික මුදල් ගිණුම්

| | | | |
|---|---|---|---|
| ශේෂය | 20 | ශේෂය | 10 |
| ආදායම් වියදම් ගිණුම හෝ | 324 ② | මුදල් ② හෝ | 816 |
| ශේෂය/ප/ගෙ | 12 | ප/ගෙ | 30 |
| | 356 | | 356 |
| ඉ/ශෙ/ඉ/ගෙ | 30 | ඉ/ගෙ/ඉ | 12 |

නාට්‍ය සංදර්ශනයේ ආදායම් ප්‍රකාශනය

**ආදායම් (රු 000)**

| | | |
|---|---|---|
| ප්‍රවේශපත්‍ර ආදායම | | ① 1100 |
| අනුග්‍රහ දායකත්වය | | 120 |
| | | 1220 |
| **වියදම්** | | |
| ප්‍රචාරණය | 30 | |
| ප්‍රවේශ පත්‍ර මුද්‍රණය | 15 } ① | |
| නාට්‍ය ශිල්පීන්ට | 500 | |
| | | (545) |
| ලාභය | | 675 ① |

ඉතිරි අයිතම 2 කට ලකුණු 01 බැගින් (ල.2)

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලහිරු ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය (000)

| | | |
|---|---|---|
| ආදායම් | | |
| සාමාජික මුදල් | 3240 ② | |
| යාවජීව සාමාජික මුදල | 36 ① | |
| පරිගණක පරිත්‍යාග | 40 ① | |
| ස්ථාවර තැන්පතු පොලී | 28 ① | |
| ක්‍රීඩා පිටිය කුලියට දීම | 240 ① | |
| නාට්‍ය සංදර්ශන ලාභය | 675 ① | |
| | | 1343 |
| වියදම් | | |
| සේවක වැටුප් | 84 | |
| විදුලි ගාස්තු | 35 } ① | |
| ක්‍රීඩා පිටිය නඩතතු වියදම් | 120 | |
| ක්‍රීඩා භාණ්ඩ ක්ෂය | 90 ① | |
| පරිගණක යන්ත්‍ර ක්ෂය | 20 ① | |
| | | 349 |
| අතිරික්තය ① | | 994 |

2018.04.01 සමුච්චිත අරමුදල

| | |
|---|---|
| හිඟ සාමාජික මුදල | 20 |
| ක්‍රිඩා භූමිය | 3000 |
| ක්‍රීඩා උපකරණ | 300 } ③ |
| බැංකු ශේෂය | 150 |
| | 3470 |
| ( - ) කලින් ලද සාමපික මුදල | 10 |
| | 3460 |

| | | |
|---|---|---|
| 2018.04.01 දිනට සමූහ අරමුදල | | 3460 |
| අතිරික්තය | ① | 994 |
| 2019.03.31 සමුච්චිත අරමුදල | | 4454 |

හිමිකම

| | |
|---|---|
| 2019.03.31 සමූහ අරමුදල | 4454 ① |
| යාවජීව සාමාජික මුදල | 252 ① |
| පරිගණක යන්ත්‍ර පරිත්‍යාග | 120 ① |
| ක්‍රීඩා සංකීර්ණය ඉදි කිරීමේ පරිත්‍යාග | 400 ① |
| මුළු හිමිකම | 5226 ① |

ස්ථාවර තැන්පත් පොලිය ක්‍රීඩා සංකීර්ණය
ඉදි කිරීමේ අරමුදලට ගැලපීම් කිරීමට

සුළු මුදල් ගෙවීම් ජ'නලය

| දිනය | ගෙවීම් වවුචර අංකය | විස්තරය | ගෙවීම් | විශ්ලේෂන තීරු | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | ගමන් වියදම් | සංග්‍රහ වියදම් | තැපැල් හා දුරකථන | ලෙජර් තීරුව |
| 01-01 | 031 | CR පොත් මිලදී ගැනීම | 400 | 400 | - | - | - | - |
| 01-06 | 032 | බස් රථ ගාස්තු | 450 | - | 450 | - | - | - |
| 01-10 | 033 | කාබන් පෑන් මිලදී ගැනීම | 580 | 580 | - | - | - | - |
| 01-15 | 034 | දුම්රිය ප්‍රවේශපත්‍ර | 350 | - | 350 | - | - | - |
| 01-18 | 035 | දිවා ආහාර | 750 | - | - | 750 | - | - |
| 01-20 | 036 | සිසිල් බීම | 760 | - | - | 760 | - | - |
| 01-21 | 037 | දුරකථන ගාස්තු ② | 800 | - | - | - | 800 | - |
| 01-25 | 038 | තැපැල් මුද්දර | 690 | - | - | - | 690 | - |
| 01-27 | 039 | වැටුප් අත්තිකාරම් | 500 | - | - | - | - | 500 |
| 01-31 | 040 | පුතාගේ උපකාරක පන්ති | 700 | - | - | - | - | 700 |
| | | | 5980 | 980 | 800 | 1510 | 1490 | 1200 |
| | | | | ① | ① | ① | ① | ① |

සුළු මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| 01- 01 ශේෂය | 400 | කාර්යාලීය ලිපිද්‍රව්‍ය | 980 |
| අග්‍රිමය ප්‍රතිපූර්ණය කලා | 5600 | ගමන් වියදම් | 800 |
| | | සංග්‍රහ වියදම් | 1510 |
| | | තැපැල් හා දුරකථන | 1490 |
| | | වැටුප් අත්තිකාරම් | 500 |
| | | උපකරණ ප්‍රත්‍යාගණන | 700 |
| | | ගෙ/පා/ගෙ | 20 |
| | 6000 | | 6000 |

(අයිතම 3 කට ලකුණු 01 බැගින් ල.03)

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | | | |
|---|---|---|---|
| පළමු පත්‍රයට | 4 x 40 | = | 160 |
| දෙවන පත්‍රය ප්‍රශ්න 4 කට එක් ප්‍රශ්නයකට ලකුණ | 40 x 4 | = | 160 |
| **මුළු ලකුණු** | | | **320** |

ප්‍රතිශතය $\frac{X}{320} \times 100$



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via
WhatsApp
071 777 4440